නෙත් FM

# 5 පහේ පන්තිය

**01** සවස පිපෙන මලක් වන්නේ,

(1) වැටකොළු (2) ඇහැළ (3) කුමු

**02** මෙම සත්ත්ව අනුකරණ ඉරියවුව වන්නේ,



(1) කැන්ගරු ගමන

(2) වලස් ගමන

(3) දළඹු ගමන

**03** ජාතික ගීය ගායනය සම්බන්ධ සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ජාතික කොඩිය එසවීමට පෙර ජාතික ගීය ගායනා කරයි.

(2) ජාතික කොඩිය ඔසවා අනතුරු ව ජාතික ගීය ගායනා කරයි.

(3) ජාතික කොඩිය ඔසවන අතරතුර ජාතික ගීය ගායනා කරයි.

**04** රාජ්‍ය ලාංඡනයේ පුන්කලස ඇත්තේ,

(1) රාජ්‍ය ලාංඡනයේ ඉහළින් ම (2) රාජ්‍ය ලාංඡනයේ පහළින් ම (3) රාජ්‍ය ලාංඡනයේ හරි මැදින් ම

**05** මිලාද් උත්සවය පවත්වන්නේ කුමන ආගමේ අය ද?

(1) හින්දු (2) ඉස්ලාම් (3) කතෝලික

**06** ලංකාව සම්පූර්ණයෙන් ම ඉංග්‍රීසීන්ට යටත් වූයේ,

(1) 1505 දී ය. (2) 1815 දී ය. (3) 1948 දී ය.

**07** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ලබාගත නොහැකි සේවාවක් වන්නේ,

(1) වාර්ෂික වාහන බලපත්‍රය ලබා ගැනීම (2) උප්පැන්න සහතික පිටපත් ලබා ගැනීම

(3) පාර්සල් ලියාපදිංචි කිරීම

**08**



රූපයෙන් දැක්වෙන අය සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) 1848 විමුක්ති සටන මෙහෙයවීම

(2) ජාතික නිදහස පිළිබඳ පද්‍ය රචනා කිරීම

(3) නිදහස් සටනේ පුරෝගාමියකු වීම

**09** මාර්ග සිතියම්වල දී අධිවේගී මාර්ග දැක්වීමට යොදා ඇති වර්ණය වන්නේ,

(1) කළු (2) රතු (3) දම්

**10** පාත්තිවල කෙලින් ම බීජ සිටුවන බෝගයක් වන්නේ,

(1) තක්කාලි (2) මාළුමිරිස් (3) කැරට්

**11** පාද 10ක් ඇති සතුන් දෙදෙනෙකු වන්නේ,

(1) ඉස්සා - කකුළුවා (2) මකුළුවා - ගෝනුස්සා (3) සමනලයා - බත්කූරා

**12**



රූපයේ දැක්වෙන සත්ත්වයා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) දිවා කාලයේ කෑම සොයා යයි.

(2) රාත්‍රී කාලයේ කෑම සොයා යයි.

(3) ශාක භක්ෂක සතෙකි.

**13** විවිධ සතුන්ගේ ගමන් ඉරියවු අනුකරණය කිරීමේ වාසියක් නොවන්නේ,

(1) විවිධ චලන පහසුවෙන් කිරීමට හුරුවීම (2) ශරීරය ක්‍රමයෙන් දුර්වල වීම

(3) මාංස පේශි ශක්තිමත් වීම

**14** ලීයක් සුමට කිරීමට භාවිත කරන උපකරණය වන්නේ,

(1)



(2)



(3)



**15** අතීතයේ තෙල් සිඳීම සඳහා භාවිත කළේ,

(1) කිණිහිර (2) සකපෝරුව (3) සෙක්කුව

**16** අප මිල දී ගන්නා ආහාර ද්‍රව්‍යවල ලේබලයක දක්නට නොහැකි දෙයක් වන්නේ,

(1) මිල දී ගත හැකි වෙළෙඳසැලේ නම (2) නිෂ්පාදිත දිනය

(3) කල් ඉකුත්වීමේ දිනය

**17** නිතර ම අප ආහාරයට ගත යුත්තේ,

(1) ශීතකරණයේ දමන ලද එළවළු, පලතුරු හා පලා වර්ග

(2) අලුත් එළවළු, පලතුරු හා පලා වර්ග

(3) රසායනික ද්‍රව්‍ය යෙදූ එළවළු, පලතුරු හා පලා වර්ග

18 ඇලුමිනියම් භාජනවල නොදැමිය යුතු ආහාර වර්ගයක් වන්නේ,

(1) කිරිකොස් මාළුව (2) දෙහි ඇඹුල් යෙදූ සම්බෝල (3) අර්තාපල් ව්‍යංජනය

19 නිවස තුළ ගෑස් කාන්දුවක් ඇති වුවහොත් අප මුලින් ම කළ යුත්තේ,

(1) දොර ජනෙල් වසා දැමීම (2) දොර ජනෙල් විවෘත කිරීම (3) අසල්වැසියන්ට කථා කිරීම

20 හදිසි අනතුරක දී ගිලන් රථයක් ගෙන්වා ගැනීම සඳහා අප ඇමතිය යුතු දුරකථන අංකය වන්නේ,

(1) 1990 (2) 1929 (3) 119

21 ජලයට දැමූ විට ටික වේලාවක් පාවී පසුව යට යන ද්‍රව්‍යයක් වන්නේ,

(1) ඉටි රෙදි කැබැල්ලක් (2) කාසියක් (3) කපු රෙදි කැබැල්ලක්

22 දේවානම්පියතිස්ස රජතුමා කර වූ වැවක් වන්නේ,

(1) තිසා වැව (2) කලා වැව (3) මින්නේරිය වැව

23 

මෙම මාර්ග සංඥාවෙන් ප්‍රකාශ කරන්නේ,

(1) වාහන ඉස්සර කිරීම තහනම් ය.

(2) වාහන නැවැත්වීම තහනම් ය.

(3) නලා ශබ්ද කිරීම තහනම් ය.

24 වර්තමානයේ පාරක් හෝ යම් ස්ථානයක් සොයා ගැනීමට වඩාත් පහසු වන්නේ,

(1) මාර්ග දැන්වීම් පුවරු කියවීම (2) මාලිමා යන්ත්‍රය භාවිත කිරීම

(3) ජංගම දුරකථනයේ Google සිතියම භාවිත කිරීම

25 පුරුක් පණුවා හානි කරන්නේ,

(1) වී වගාවට ය. (2) පලතුරු වගාවට ය. (3) පොල් වගාවට ය.

26 

මෙම උපකරණය භාවිත කරන කර්මාන්තය වන්නෙ

(1) ධීවර කර්මාන්තය (2) වඩු කර්මාන්තය

(3) පෙදරේරු කර්මාන්තය

27 චුම්බකයකට යම් දෙයක් ළං කළ විට ඇත් විය. එය විය හැක්කේ,

(1) පිත්තල කැබැල්ලකි. (2) රන් කැබැල්ලකි. (3) තවත් චුම්බකයකි.

28 ශ්‍රී ලංකා සිතියමේ එක්තරා පළාතක සිතියමක් පහත දැක්වේ. එම පළාත විය හැක්කේ,



(1) වයඹ පළාත

(2) නැගෙනහිර පළාත

(3) බස්නාහිර පළාත

29 ගඩොල් කැටයක් වතුර භාජනයකට දැමූ විට බුබුළු මතු විය. මින් අප නිගමනය කරන්නේ,

(1) පස තුළ ජීවීන් සිටින බව ය. (2) පසට වාතය උරා ගන්නා බව ය. (3) පස තුළ වාතය ඇති බව ය.

30 චන්ද්‍රග්‍රහණයක් දැකිය හැක්කේ,

(1) පසළොස්වක දිනක දී ය. (2) අමාවක දිනක දී ය. (3) අව අටවක දිනක දී ය.